## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික (ශිල්පීය නොවන) සේවා ව්‍යවස්ථා

## සේවා ව්‍යවස්ථා සංශෝධන - අංක : 01.

| ඡේදය අංකය | දැනට තිබෙන පෙළ | යෝජිත සංශෝධනය | සංශෝධනයට හේතුව |
|---|---|---|---|
| 8.1.12 | තනතුරු නාමය - ක්‍රීඩා උපදේශක | ක්‍රීඩා උපදේශක යන්න ඉවත් කිරීම. | 2011.12.23 දින අනුමත ප්‍රාථමික ශිල්පීය ව්‍යවස්ථාවේ PL 3 – 2006 A වැටුප් කේතය යටතේ ඇතුලත් කර ඇති බැවින් නැවත ශිල්පීය නොවන සේවා ව්‍යවස්ථාවට PL 1 – 2006 A වැටුප් කේතය යටතේ ඇතුලත්වීම තුළ එම සේවකයන්ට අසාධාරණයක් සිදුවේ. ( 2013 කාර්ය මණ්ඩල වාර්තාවේ play Ground Instructor ලෙස සඳහන්ව ඇති අතර එය භාෂා පරිවර්තනයේදී ක්‍රීඩා භූමි උපදේශක ලෙස භාවිතා කළ යුතුවේ.) |
| 8.1.28 | තනතුරු නාමය- නළ ළිං කාර්මික | නළ ළිං කාර්මික යන්න ඉවත් කිරීම. | 2013 කාර්ය මණ්ඩල වාර්තාවේ PL 2 – 2006 A වැටුප් කේතය යටතේ සඳහන්ව ඇති නළ ළිං කාර්මික (Tube Well Technician) තනතුර 2014.07.18 දින අනුමත පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන) සේවා ව්‍යවස්ථාවේ PL 1 – 2006 A වැටුප් කේතයට අයත් තනතුරක් ලෙස නැවතත් ඇතුලත් වී ඇත. |
| 8.1.34 | තනතුරු නාමය- පරිපාලක සිවිල් | ඕවර්සියර් සිවිල් ( Overseer Civil) | භාෂා පරිවර්තනයේදී Overseer යන නාමය කංකානම ලෙස අර්ථකථනය කිරීමේදී MN 1 – 2006 A යටතේ පරිපාලක සිවිල් තනතුරේ සේවය කරන නිලධාරීන් අසාධාරණයක් සිදුවන බැවින්. |
| 8.1.36 | තනතුරු නාමය- ප්‍රවාහන නිලධාරී (නුවරඑළිය මහ නගර සභාවට සඳහා පමණි) | ප්‍රවාහන නිලධාරී (මාතලේ මහ නගර සභාව සඳහා පමණි) | ප්‍රවාහන නිලධාරී තනතුර මාතලේ මහ නගර සභාව සඳහා පමණක් අයත් තනතුරකි. |
| 8.1.40 | තනතුරු නාමය- ක්‍රීඩා භූමි පරිපාලක | ක්‍රීඩා භූමි පරිපාලක යන්න ඉවත් කිරීම. | 2013 කාර්ය මණ්ඩල වාර්තාවේ MN 1 – 2006 A වැටුප් කේතයට අයත් තනතුරක් ලෙස ඇතුලත් කර ඇති බැවින් හා එය අධීක්ෂණ මට්ටමේ තනතුරකි. |
| 8.1. | දැනට ව්‍යවස්ථාවට ඇතුලත්ව නොමැති තනතුරකි. | 52. සුළු පරිපාලක (සෞඛ්‍ය) | 2013 කාර්ය මණ්ඩල වාර්තාවට අනුව සුළු පරිපාලක (සෞඛ්‍ය) Minor Supervisor (Health) PL 1 – 2006 A වැටුප් කේතයට අයත් තනතුරක් වන හෙයින් එම තනතුර මෙම මෙම ව්‍යවස්ථාවට ඇතුලත් කළ යුතුය. |

අනුමත කරමි/ ~~නොකරමි~~

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

2015/09/22

| | | | |
|---|---|---|---|
| 9.2.2.1 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින්විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරකදී සමත්ව තිබිය යුතුය. | i. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක්වරක දී සමත්ව තිබිය යුතුය.<br>ii. සෞඛ්‍ය කම්කරු, මාර්ග කම්කරු, වැඩ කම්කරු, ගස් කපන්නා, බල්ලන් අල්ලන්නා යන තනතුරු සඳහා පමණක් මෙම පරිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් නොමැති අවස්ථාවලදී පරිපාටියේ සඳහන් සුදුසුකම් 5 ශ්‍රේණිය සමත්වීම දක්වා අඩුකර බඳවා ගැනීමට ක්‍රියා කළ හැකිය. | එම තනතුරු සඳහා බඳවා ගැනීමේදී ව්‍යවස්ථාවේ සඳහන් සුදුසුකම් සැලකිල්ලට ගනිමින් බඳවා ගැනීම හා ඔවුන්ව සේවයේ යොදවා ගැනීම ප්‍රායෝගිකව අපහසු වන බැවින් එවැනි තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම් ලිහිල් කිරීම සුදුසු බවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 36/2013 පරිදි නව ඡේදයක් ඇතුලත් කිරීම. |
| 14.1.v | පොදු කරුණු :<br>v. අන්තර්ග්‍රහණය කරනු ලබන සේවකයින්ට විධිමත් පත්වීමේ ලිපියක් මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. | v. අන්තර්ග්‍රහණය කරනු ලබන සේවකයින්ට විධිමත් පත්වීමේ ලිපියක් පත්වීම් බලධාරයා විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත. | මධ්‍යම පළාතේ, පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යාව විශාල ප්‍රමාණයක් සිටින බැවින් අන්තර්ග්‍රහණ ලිපි නිකුත් කිරීමේ ප්‍රායෝගික ගැටළුවත් පැවතීම. |
| 19 | මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2009.07.29 දින අනුමත කර ලද ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව නියමිත ශ්‍රේණියට දැනටමත් අන්තර්ග්‍රහණය සිදුකර ඇත්නම් මෙම ව්‍යවස්ථාව යටතේ ද අන්තර්ග්‍රහණය කිරීමේදී අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණියේ කිසිදු වෙනසක් සිදු නොවේ. | මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2009.07.29 දින අනුමත කරන ලද ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව නියමිත ශ්‍රේණියට දැනටමත් අන්තර්ග්‍රහණය කිරීමේදී අන්තර්ග්‍රහණය කරනු ලබන ශ්‍රේණියේ කිසිදු වෙනසක් ඇති නොවේ. නමුත් යම්කිසි නිලධාරියෙකු 2009.07.29 දින සිට 2014.07.18 දින දක්වා වූ කාලසීමාව තුළ ඔහුගේ ඊළග උසස්වීම සඳහා වූ අදාළ උසස්වීම් ලබාදී ඉන් අනතුරුව 2014.07.18 දිනැති ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කළ යුතුය | සේවකයන් මෙම ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය කිරීමේදී 2009.07.29 වන දින අනුමත ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණයවී සිටින ශ්‍රේණියේ මේ වන විට වසර 05ක් සේවයේ යෙදී සිට ඇති හෙයින් 2009.07.29 දින සිට 2014.07.18 දින දක්වා යම් උසස්වීමක් ලැබීමට සුදුසුකම් ලැබුවේ නම් එම උසස්වීම ලබන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතු වීම. |

නම

අත්සන

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ..................

02. යූ.ඒ. බෝගහපිටිය මහතා (සාමාජික) ..................

03. පී.පී.එස්.ඒ. දිසානායක මිය (සාමාජික) ..................

04. වී.නන්දකුමාර් මහතා (සාමාජික) ..................

05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා (සාමාජික) ..................

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :

අනුමත කරමි/නොකරමි

..................

සුරංගනී ඇල්ලාවල

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

20.15/09/22...